Alcohol and Drug
Information Centre

ADIC

No.40/18, Park Road, Colombo 5, Sri Lanka.
Tel: +94 11 2584416, +94 11 2592515, Fax: +94 11 2508484
E-mail: info@adicsrilanka.org, adicc@sltnet.lk
Web Site: http://www.adicsrilanka.org

මාධ්‍ය නිවේදනය
ලෝක දුම්වැටි නිවාරණ දිනය - 2021 මැයි 31

**“දුම්බීම නැවැත්වීම සඳහා කැපවෙමු” යන්න මෙවර ලෝක දුම්වැටි නිවාරණ දිනයේ තේමාව යි.**

දුම්බොන්නන් දෙදෙනෙකුගෙන් එක් අයෙක් මරා දමන, දිනකට ශ්‍රී ලාංකිකයන් 55 ක් ඇතුළුව වසරකට සමස්ත ලෝකය තුල මිනිසුන් මිලියන 8 ක් අකාලයේ මරා දමන දුම්වැටිය තවමත් නිත්‍යානුකූල නිෂ්පාදනයකි.

දුම්වැටිය, දුම්බොන්නා පමණක් නොව එම පුද්ගලයාගේ ආශ්‍රිතයන් රෝගීන් කිරීමටත්, මරා දැමීමටත් සෘජුව දායක වන සමස්ථ මානව ප්‍රජාවටම දුකම උරුම කරන භාණ්ඩයකි.

මෙවර ලෝක සෞඛ්‍ය සංවිධානයේ ලෝක දුම්වැටි නිවාරණ දින තේමාව වන්නේ දුම්බීම නැවැත්වීමට කැපවෙමු යන්නයි. හෘද රෝග, පිළිකා, ශ්වසන රෝග සහ දියවැඩියාව වැනි බෝ නොවන රෝග සඳහා දුම්කොළ ප්‍රධාන අවදානම් සාධකයකි. ලෝක සෞඛ්‍ය සංවිධානය මේ වසර මුලදී විද්‍යාත්මක සංක්ෂිප්තයක් නිකුත් කරමින් කියා සිටියේ දුම්බොන්නන් Covid-19 වෛරසයට ගොදුරු වීමට හා මරණයට පත්වීමේ වැඩි අවදානමක් ඇති බවයි.

දුම්බොන්නන්ට Covid-19 වෛරසය ශරිරගත වීමට වැඩි අවදානමක් ඇත්තේ ඔවුන් නිරන්තරයෙන් තොල් දෙසට අත තබන බැවිනි. දුම්බොන්නන් තුල ප්‍රතිශක්තිය දුර්වල වන බැවින් ඔවුන්ට කොවිඩ්-19 වැළඳීමට වැඩි අවස්ථාවක් තිබෙන අතර Covid-19 වයිරසය ආසාදනය වුවහොත්, ඔවුන්ගේ පෙනහළු ක්‍රියාකාරිත්වය අඩපණ වී ඇති හෙයින්, ඔවුන්ගේ රෝගීතත්වය දරුණු අතට පත්වී මරණයට පත්වීමේ වැඩි අවදානමක් ඇත.

එමෙන්ම දුම්වැටිය රටේ සෞඛ්‍යට, ආර්ථිකයට, පුවුලේ සතුට සහ සමගියට සෘණාත්මක බලපෑමක් ඇතිකරන දුෂ්ය භාණ්ඩයකි. එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල සහ ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2016 වසරේදී ශ්‍රී ලංකාවේ සිදුකල සමීක්ෂණයකට අනුව දුම්බීම නිසා ඇති වූ මරණ, රෝග සහ අනිකුත් බලපෑම් නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට රුපියල් බිලියන 214ක් පාඩුවක් සිදුකොට ඇත. නමුත් එම වසරේදී දුම්කොළ සමාගම විසින් රජය ලබාගෙන ඇති බදු ප්‍රමාණය බිලියන 92.9 ක් පමණි.

දුම්බොන්නන්ට තම දුම්වැටි භාවිතය නැවැත්වීමත් එම තත්වය පවත්වා ගැනීමත් මෙම කාලය තුළ අනිවාර්යයයෙන්ම සිදුකල යුත්තේය. තමන් සහ තම ආදරණියන් මෙම ව්‍යසනයෙන් බේරීමට නම් දුම්බීම නැවැත්වීම අනිවාර්යෙන්ම කල යුත්තකි.

රටක් වශයෙන් කොරෝනා වසන්ගතයේ ඉතාමත් දරුණු අවස්ථාවකට මුහුණ දෙමින් සිටින, අතිශය තීරණාත්මක අවස්ථාවකදි වසර ගණනාවක සිට ඉල්ලීම් කලද, තවමත් ක්‍රියාත්මක නොකල දුම්වැටි භාවිතය අවම කිරීම සඳහා පහතින් සඳහන් ප්‍රතිපත්ති වහා ක්‍රියාත්මක කර රටත් ජනතාවත් ආරක්ෂා කිරීම වගකීමක් සහිත රජයක ප්‍රමුඛ කාර්යය විය යුතු බව මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය අවධාරණය කර සිටී.

1. තනි තනිව අලෙවි කරන දුම්වැටි අලෙවිය තහනම් කර පැකට් වශයෙන් පමණක් දුම්වැටි අලෙවි කිරීම.
2. අධ්‍යාපන ආයතනයක සිට මීටර් 100ක් ඇතුළත දුම්වැටි අලෙවිය තහනම් කිරීම.
3. සිගරට් සඳහා නිශ්චිත අවම මිලක් නියම කිරීම තුළින් සිගරට් අඩු මිලට විකිණීම නැවැත්වීම.
4. සම්මත අසුරුම්කරණය (Plain Packaging) හඳුන්වාදීම.
5. පාසල් පද්ධතිය තුළ දුම්කොළ සමාගම්වලින් සිදුකරන විවිධ උපක්‍රම පිළිබඳ දරුවන් දැනුවත් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් දියත් කිරීම.
6. අන්තර්ජාලය හා අනෙකුත් මාධ්‍ය හරහා සිදුකරන ප්‍රචාරණයන් වැලැක්වීම සඳහා දැනටමත් එම පනත උල්ලංඝණය වන අවස්ථාවල දී ඒ පිළිබඳ නීතිය ක්‍රියාත්මක කරවීම කාර්යක්ෂම කිරීම.

දුම්වැටි සමාගම් වල මුදල් බලය සහ කූට උපක්‍රම පරාජය කරමින්, රටේ තරුණ පිරිස් සහ තවමත් දුම්බීමට හසුවී සිටින අසරණ පිරිස් එම තත්වයෙන් ආරක්ෂා කර ගැනීමට ජාති ආගම්, පක්ෂ පාට භේදයකින් තොරව කටයුතු කිරීම සියලුම දෙනා සතු වගකීමකි.

පුබුදු සුමනසේකර

විධායක අධ්‍යක්ෂ
මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය,
නො. 40/18,
උද්‍යාන පාර,
කොළඹ 05.